# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011 (3 අදියර)
## තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම

අංක 1699/35 හා 2011 මාර්තු මස 30 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නිල කාලය 2011 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා දීර්ඝ කරන ලද පළාත් පාලන ආයතන 23 සම්බන්ධයෙන් නාමයෝජනා කැඳවීමේ දැන්වීම අදාල තේරීම්භාර නිලධාරීන් විසින් 2011.08.04 දිනෙන් යුතුව ප්‍රකාශයට පත් කර ඇත.

02. මෙම ඡන්ද විමසීම පළාත් පාලන ආයතන 23 කට පමණක් සීමාවී ඇති බැවින් තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් සැලසිය යුතු වන්නේ ඡන්ද විමසීම් රාජකාරී, අත්‍යවශ්‍ය සේවා සහ ආරක්ෂක අංශ රාජකාරී සඳහා එම පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ඡන්ද හිමියන් වශයෙන් ලියාපදිංචි නිලධාරීන් අතුරෙන් සේවයේ යොදවා ගැනීම අත්‍යවශ්‍ය නිලධාරීන් සඳහා පමණි. අනෙකුත් නිලධාරීන්ට පෞද්ගලිකව ඡන්ද පොළට ගොස් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය නිවාඩු ලබා දිය හැකිය. ඉහත සඳහන් රාජකාරී සඳහා ඡන්ද විමසීම් පැවැත්වීමට නියමිත ප්‍රදේශ වලින් බැහැර නිලධාරීන් සේවයේ යොදා ගැනීමෙන් අනවශ්‍ය පරිදි තැපැල් ඡන්ද හිමිකම ඉල්ලා සිටීම වලකා ගත හැකිය.

03. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත අනුව තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීම නාමයෝජනා දින සිට දින 10 කින් අවසන්වේ. එහෙත් තැපැල් ඡන්ද හිමියන් සඳහා තවදුරටත් අවස්ථාව දීමක් වශයෙන් තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීම 2011.08.25 වැනි දින දක්වා දීර්ඝ කරනු ලබන බව දැනුම් දෙනු ලැබේ. මෙම දිනයෙන් ඔබ්බට නැවත දින දීර්ඝ කිරීමක් සිදු කරනු නොලැබේ. තැපැල් ඡන්ද අයදුම්කරුවන්ගේ පහසුව සඳහා සියළුම මැතිවරණ දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලදී සහ කොළඹ දිස්ත්‍රික්කයේ පසුගිය ඡන්ද විමසීම් අවස්ථාවේ නාමලේඛන ප්‍රදර්ශනය කළ සියලුම ස්ථාන වලදී මෙවර ඡන්ද විමසීම පැවැත්වීමට නියමිත සියළුම පළාත් පාලන ආයතන වලට අදාල නාමලේඛන ප්‍රදර්ශනය කරනු ලැබේ. අවශ්‍ය තැපැල් ඡන්ද අයදුම්පත් එම නාමලේඛන ප්‍රදර්ශන ස්ථාන වලින් ලබාගත හැකිය.

04. තැපැල් ඡන්ද අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කරනු ලබන අයදුම්පත් තමාගේ ආසන්නතම ආයතන ප්‍රධානියා ලවා තමා එම ආයතනයේ සේවය කරන නිලධාරියකු බවට සහතිකය ලබා ගත යුතු අතර අනතුරුව එම ආයතනය සඳහා පත්කර ඇති සහතික කිරීමේ නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුය. සහතික කිරීමේ නිලධාරී විසින් අයදුම්පත නැවත පරීක්ෂා කර සහතික කර අදාල තේරීම්භාර නිලධාරී වෙත යැවිය යුතුය. මේ සඳහා තැපැල් ගාස්තු ගෙවීමක් අවශ්‍ය නොවන අතර ලිපි කවරයේ " ප්‍රමුඛ සේවා" ලේබලය ඇලවීම හෝ ප්‍රමුඛසේවා යන්න සටහන් කිරීම හෝ ප්‍රමාණවත්වේ.

**05. සහතික කිරීමේ නිලධාරීන් විසින් තැපැල් ඡන්ද අයදුම්පත් යැවිය යුතු තේරීම්භාර නිලධාරීන්ගේ ලිපිනයන් පහත දක්වා ඇත.**

| දිස්ත්‍රික්කය | පළාත් පාලන ආයතනය | තෙරීම්භාර නිලධාරී ලිපිය |
|---|---|---|
| කොළඹ | කොළඹ මහ නගර සභාව<br>දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව<br>ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව<br>මොරටුව මහ නගර සභාව | තේරීම්භාර නිලධාරී<br>කොළඹ මහ නගර සභා මැතිවරණ කාර්යාලය, 395,<br>පරණ කෝට්ටේ පාර, රාජගිරිය |
| | කොළොන්නාව නගර සභාව<br>කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව | තේරීම්භාර නිලධාරී<br>කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය, 395,<br>පරණ කෝට්ටේ පාර, රාජගිරිය |
| ගම්පහ | මීගමුව මහ නගර සභාව<br>ගම්පහ මහ නගර සභාව | |
| මහනුවර | මහනුවර මහ නගර සභාව<br>කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව<br>මහනුවර කඩවත් සතර සහ ගඟ වට කෝරළේ ප්‍රාදේශීය සභාව | |
| මාතලේ | මාතලේ මහ නගර සභාව | තේරීම්භාර නිලධාරී<br>අදාල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය |
| නුවරඑළිය | නුවරඑළිය මහ නගර සභාව | |
| ගාල්ල | ගාල්ල මහ නගර සභාව | |
| මාතර | මාතර මහ නගර සභාව | |
| හම්බන්තොට | හම්බන්තොට මහ නගර සභාව<br>සූරිය වැව ප්‍රාදේශීය සභාව<br>හම්බන්තොට ප්‍රාදේශීය සභාව | |
| අම්පාර | කල්මුනේ මහ නගර සභාව | |
| කුරුණෑගල | කුරුණෑගල මහ නගර සභාව | |
| අනුරාධපුර | අනුරාධපුර මහ නගර සභාව | |
| බදුල්ල | බදුල්ල මහ නගර සභාව | |
| රත්නපුර | රත්නපුර මහ නගර සභාව | |

මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.
2011 අගෝස්තු මස 08 දින.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

LAEB/COM1/Ga 20110808-02